# දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම - 2014

**දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල බැංකු අංශය විසින් නිකුත් කරනු ලබන**

**චක්‍රලේඛ අංක 13**

1. පාලක මණ්ඩලය,
   දිවි නැගුම ප්‍රජාමූල බැංකුව, ...............................

2. කළමනාකරු,
   දිවි නැගුම ප්‍රජාමූල බැංකුව, ...............................

3. සභාපති, විධායක කමිටුව,
   දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිතිය, .....................

4. කළමනාකාරු,
   දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිතිය, ..........................................

5. දිවි නැගුම ප්‍රාදේශිය නිලධාරි,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .......................................

7. දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................

8. දිස්ත්‍රික් දිවි නැගුම නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, .......................................

9. දිස්ත්‍රික් දිවි නැගුම නිලධාරි (ක්ෂුද්‍රමූල්‍ය),

10. දිස්ත්‍රික් ලේකම්

11. කලාප අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල්වරුන්

12. ප්‍රධාන අභ්‍යාන්තර විගණක,
    දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව.

11. සියලුම අධ්‍යක්ෂවරු,

12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.


**ප්‍රජාමූල බැංකු කටයුතු අංශය, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,**

**අංක.24/4, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08.**


**2014.12.17**


දුරකථන අංකය :- 0112 –669727    ෆැක්ස් අංකය :- 0112 - 696592

2014.12.17

**<u>දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම - 2014</u>**

**1. හැඳින්වීම.**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භවීමත් සමග එහි පාලනය යටතේ පවතින දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති වර්ෂ අවසාන ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට, අවශ්‍ය මඟ පෙන්වීම්, උපදෙස් ලබාදීම , මේ මගින් අදහස් කරනු ලබයි. සමෘද්ධි අධිකාරිය යටතේ නිකුත් කළ මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 සහ ඊට අදාල එකතුන් මෙම අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී ද අදාල කරගත යුතුය. ඊට අමතරව මෙම මඟ පෙන්වීම් ලිපියෙහි සඳහන් උපදෙස් හා මඟ පෙන්වීම් හා ගණනය කිරීම් ද ඇතුළත්ව වන පරිදි ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන් අවසාන ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට වග බලාගත යුතුය.

**2. දිවිනැගුම ප්‍රජා මුල බැංකු සාමාජිකයින්, විසින් සම්පූර්ණ කරන ලද සාමාජික කොටස් සඳහා ලාභාංශ හෝ කොටස් පොලිය ලබාදීම.**

2.1. 2013 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල දිවිනැගුම ප්‍රජා මුල බැංකුවල ලාභය පදනම් කරගෙන 2014 වසර සඳහා අතුරු ලාභාංශ මෙවර ප්‍රකාශයට පත් කෙරේ.

ඒ අනුව යොමු අංක DDD/HO/MF/05 යටතේ 2014.11.28 දින නිකුත් කළ ලිපිය අනුව කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමට මාරු කරන ලද අරමුදල් පදනම් කරගෙන 10% ක අතුරු ලාභාංශයක් ප්‍රකාශයට පත් කළ හැකිය. 2014.01.01 දිනට සම්පූර්ණ කරන ලද කොටස් සඳහා කොටස් හිමි සාමාජිකයන්ට මෙම ලාභාංශය ලබාදිය යුතුය.

2.2. 2014 වර්ෂය තුල කිසිඳු මූල්‍ය ප්‍රකාශනයක් අනුමත වී නොතිබුණ ද, පසුගිය වර්ෂවල අනුමත වී ඇති මූල්‍ය ප්‍රකාශන අනුව කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමේ 2014 වර්ෂය සඳහා ලාභාංශයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් අනුමත වූ ශේෂයක් ඉතිරිව ඇත්නම් ඉහත 2.1 පරිදි 10% ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කළ හැකිය.

2.3. ඉහත 2.3 හි සඳහන් පරිදි අතුරු ලාභාංශයන් ලබාදීමට ප්‍රමාණවත් අරමුදල් ගිණුමේ නොමැති අවස්ථාවක 2014.01.01 දිනට සම්පූර්ණ ලද කොටස් සඳහා 5% ක වාර්ෂික කොටස් පොලියක් ලබාදිය යුතුය.

2.4. 2014 වර්ෂය තුළ කිසියම් මාසයක පෙර වර්ෂයට අදාල විගණන වාර්තාවක් අනුමත වීම තුළින් ලාභාංශ ගෙවා ඇත්නම් මෙම අතුරු ලාභාංශ ගෙවීම අවශ්‍ය නොවේ.

3. 2014 වසර සඳහා ද අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු සඳහා වාර්ෂික 5% පොලි අනුපාතයක් අනිවාර්ය ඉතිරි තැන්පත් ගිණුම් හිමියන්ට ලබාදිය යුතුය. අනිකුත් තැන්පතු සඳහා ද දැනට බල පවත්වන පොලි අනුපාතයන් නොවෙනස්ව පවතී.

4. බැංකු විසින් 8% හා 10% පොලි අනුපාත යටතේ ලබාදී ඇති ණය සඳහා මෙතෙක් ලබාදුන් 2% හා 4% සහන පොලි මුදල් 2014 වර්ෂය සඳහා හා මින් ඉදිරියට ලබාදෙනු නොලැබේ. එබැවින් 2014.01.01 දිනෙන් පසු සහන පොලි ඉල්ලීම් අප වෙත එවීමෙන් වළකින ලෙස දන්වමි.

**5. දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩල සඳහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව දරණ ලද වැටුප්, ගමන් වියදම් ඇතුළු අනිකුත් වියදම් ගැලපීම.**

5.1. මෙහෙයුම් උපදෙස් 12 ට පස්වන එකතුවේ සඳහන් පරිදි 2014 වසර තුල ප්‍රජා මුල බැංකු/ ප්‍රජා මුල බැංකු සමිති නිත්‍ය කාර්ය මණ්ඩල වෙනුවෙන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව දරණ ලද වැටුප් හා ගමන් වියදම් සත්‍ය ලෙස ගණනය කර, වැටුප් හා ගමන් වියදම් ගිණුම්වලට හර කළ යුතුය.

5.2. කාර්ය මණ්ඩල වැටුප් ගණනයේදී, පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය.

5.2.1 වර්ෂය පුරා, යම් නිලධාරියෙකු සේවයට අනුයුක්ත නොවූ විටක, දිවිනැගුම ප්‍රජා මුල බැංකු/ බැංකු සමිතියේ රැඳී සිටි රාජකාරි කාලයට ලබාගත් වැටුප පමණක් වැටුපට එකතු කළ යුතුය.

5.2.2 වැටුප් සහිත අනුමත නිවාඩු සිටින නිලධාරියෙකුගේ වැටුප ද, වැටුප් ගණනයේදී ඇතුලත් කළ යුතුය.

5.2.3 වැඩ බලන නිලධාරියෙකු, ප්‍රජා මුල බැංකුවට/ බැංකු සමිතියට අනුයුක්ත වී සිටින අවස්ථාවලදී, මාසයක වැඩිම දින ගණන හෝ අවුරුද්දේ වැඩිම මාස ගණනක්/රාජකාරි කාලයක් බැංකුවට/ බැංකු සමිතියට යොදන නිලධාරින්ගේ වැටුප, වැටුප් ගණනයේදී වැටුප් වියදමට හර කළ යුතුය.

5.3. කාර්ය මණ්ඩල වැටුප් ගණනය කිරීමේදී එක් එක් නිලධාරියාගේ මාසික දළ වැටුප, අනුව එක් එක් මාසවලට අදාල වැටුප් ප්‍රමාණයන් ගණනය කළ යුතුය. මෙහිදී කිසිදු ප්‍රජා මුල බැංකුවක හෝ බැංකු සමිතියක කාර්ය මණ්ඩල වැටුප් වියදම ඇතුලත් නොකර වාර්ෂික ලාභ අලාභ ගිණුම සකස් කිරීමට අවසරයක් නොමැති බව අවධාරණය කරමු.තවදුරටත් සේවක අර්ධසාධක අරමුදල් හා සේවක භාර අරමුදල් සාමාජිකත්වය දරණ සේවකයින්ගේ වැටුප් ගැළපීමේදි මේ පිළිබඳව පෙර වර්ෂයේ නිකුත් කළ උපදෙස් අනුගමනය කළ යුතුය.

5.4. කාර්ය මණ්ඩල ගමන් වියදම් ,වාර්ෂික වියදමක් ලෙස ගණනය කිරීමේදි එක් එක් නිලධාරියා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ඉල්ලීම් කර ඇති 2014 වසර තුල සත්‍ය වශයෙන් ලබාගත් මුදල පමණක් ඇතුළත් කිරීමට වග බලා ගත යුතුය.

5.5. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, දිවිනැගුම ප්‍රජා මුල බැංකු කටයුතු වෙනුවෙන් කාර්ය මණ්ඩල වැටුප් හා ගමන් වියදම්වලට අමතරව බොහෝ වියදම් දරයි. ඒ අතරින්, ප්‍රජා මුල බැංකු හා ප්‍රජා මුල බැංකු සමිති විගණන හා විමර්ශන කටයුතු වෙනුවෙන්, දිවිනැගුම ප්‍රජා මුල බැංකු කටයුතු අංශයේ වියදමින් අදාල විගණන නිලධාරින්ට ගෙවන ගමන් වියදම් පමණක් ප්‍රජා මුල බැංකු හා ප්‍රජා මුල බැංකු සමිති අතරේ සමානුපාතිකව බෙදා හරිනු ලැබේ. ඒ අනුව එක් එක් දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා ප්‍රජා මුල බැංකු සමිති මෙම වසරට රු. 7,095/- මුදලක් විගණන හා විමර්ශන ගාස්තු ගිණුමට හර කළ යුතුය. ඒ සඳහා ප්‍රවේශන පහත පරිදිවේ.

හර - වැය ගිණුම විගණන හා විමර්ශන ගාස්තු (කේත අංක 2136)

බැර - ග්‍රාමීය ණය අවශ්‍යතා පිරිමසා ගැනීමේ අරමුදල් ගිණුම. (කේත අංක 4033)

**6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද දිවි නැගුම සහනාධාර මුදල් ගිණුම්ගත කිරීම.**

6.1 දිවිනැගුම සහනාධාර අරමුදලින් අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිණුමේ ශේෂයක් පවතින ප්‍රජා මූල බැංකු කඩිනමින් එම ශේෂයන් අදාල ගිණුම්හිමියන්ගේ ගිණුම්වලට බැර කළ යුතුය. තවදුරටත් එම ගිණුමේ ශේෂයක් පවත්වාගෙනයාම, 2014 වසර තුල සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යභාවය පළුදුවීමට හේතුවේ.

6.2 දිවිනැගුම සහනාධාර අරමුදලින් ගණුදෙනුකරුවන්ගේ තැන්පතු ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිණුමෙහි, සාමාජිකයන්ගේ සාමාජික ගිණුම්වලට බැර කිරීමට රැස් කරන ලද අරමුදල් පවතින විටක, ප්‍රජා මූල බැංකු කඩිනමින් වැඩසටහනක් සකස් කර, එම අරමුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

6.3 ඉහත වැඩසටහන්වලට අමතරව 2012 මාර්තු මාසයට පෙර ලද සමෘද්ධි සහනාධාර අරමුදල් හා අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් වලින් මෙතෙක් අදාල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර නොකළ මුදල් ඇත්නම් කඩිනමින් අදාල ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය.

**7. ශේෂ පිරික්සුම් තුලනය කිරීම.**

සියළුම ප්‍රජා මූල බැංකු හා සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කටයුතු දිවිනැගුම ප්‍රජා මූල බැංකු අංශය විසින් නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ ලිපි අනුව සිදු කිරීමට ක්‍රියා කළ යුතුය.

**8. අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන අරමුදල් සඳහා පොලී ලබාදීම**

8.1 2012 මාර්තු මස දක්වා දිවි නැගුම ප්‍රජාමූල බැංකු විසින් ප්‍රජා මූල බැංකු කටයුතු අංශයට එවන ලද අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන අරමුදල් සඳහා නියමිත පොලී මුදල එවීම සඳහා අවශ්‍ය කටයුතු කෙරේ. එහිදී ගිණුම් තැබීම දී ඇති උපදෙස් පරිදි සිදු කළ යුතුය.

8.2 ප්‍රජා මූල බැංකු සමිති හරහා අදාල පොලී මුදල් ප්‍රේෂණය කිරීම සිදුවන අතර, යම් කිසි නොවැලැක්විය හේතුවක් මත නියමිත පොලී මුදල බැංකු සමිති ජංගම ගිණුම්වලට බැර නොවූ විටක, හෝ පොලී මුදල් සම්බන්ධ තොරතුරු බැංකුවලට ලැබී ඇත්නම් ලැබිය යුතු පොලී ආදායම සඳහා ගිණුම් සටහන් තබාගැනීමට ඉඩදෙනු ලැබේ. ඒ සඳහා ගිණුම් සටහන පහත පරිදිවේ.

හර - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණ කළ

යුතු අරමුදල් ගිණුම(කේත අංක 3309)

(සත්‍ය වශයෙන් ලැබෙන ශුද්ධ පොලී මුදල)

හර	- වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන කටයුතු (කේත අංක 2131)

(ප්‍රචාරණ කටයුතු සඳහා රඳවාගත් මුදල්)

බැර	- ලද පොලි - අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම (කේත අංක 1008)

8.3 අදාල පොලි ආදායම, ප්‍රජාමුල බැංකු සමිති ජංගම ගිණුමට බැර වී අදාල නිවේදනය ප්‍රජා මුල බැංකුවට ලද විටක පහත ගිණුම් සටහන් තබමින්, නිශ්චිත පොලි ආදායම ගිණුම්වලට ගත යුතුය.

හර	- ජංගම ගිණුම/ ආයෝජන සඳහා ප්‍රජා මුල බැංකු සමිතියට

යවන ලද අරමුදල් ගිණුම.

බැර	- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය

කරගත යුතු අරමුදල් ගිණුම.

එසැනින් අදාල ලෙජර් හෝ රෙජිස්තරවල සටහන් තැබීමට වගබලා ගත යුතුය.

## 9. දිවිනැගුම ප්‍රජා මුල බැංකු/ බැංකු සමිති විසින් කරන ලද ආයෝජනවල ශේෂ තහවුරු ලබාගැනීම.

9.1 ප්‍රජා මුල බැංකු සමිති කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2015 ජනවාරි 10 දිනට පෙර රාජ්‍ය බැංකු ආයතනවල ආයෝජනය කර ඇති අරමුදල් වලින්, කල්නොපිරුණු අරමුදල් පිළිබඳ ශේෂ තහවුරුවක් ලබාගෙන ආයෝජන ශේෂයන් වල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. එම ශේෂ තහවුරු ලිපි සුරක්ෂිතව ගොනු කල යුතුය.

9.2 දිවිනැගුම ප්‍රජා මුල බැංකු විසින් ද, ලිඛිතව බැංකු සමිතිවල කරන ලද ආයෝජන පිළිබඳ ශේෂ තහවුරුවක් කඩිනමින් ලබාගෙන අරමුදල් ආයෝජනවල නිවැරදි බව තහවුරු කරගත යුතුය. එම ශේෂ තහවුරු සුරක්ෂිතව ගොනු කළ යුතුය. දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති, ප්‍රජා මුල බැංකුවලට අදාල ශේෂ තහවුරු ලිපි ලබාදීමට බැඳී සිටියි.

9.3 ශේෂ පිරික්සුම් තුලනය නොවන ප්‍රජා මුල බැංකුවල 2014.12.31 දිනට ණය ගිණුම් පිළිබඳ සහ තැන්පතු ගිණුම්වල ශේෂ තහවුරු කිරීමක් ලබාගෙන වාර්ෂික ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

## 10. වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

10.1 2014 වර්ෂයට අදාල පහත ප්‍රකාශන ප්‍රජා මුල බැංකු හා බැංකු සමිති විසින් සකස් කිරීම කළ යුතුය. (හඳුන්වා දී ඇති ආකෘතින්ට අනුකූලව)

10.1.1	2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය.

10.1.2	2014.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

10.1.3	2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය.

10.1.4	ගිණුම්කරණ ප්‍රතිපත්ති.

10.2 ඡේද 10.1 හි සඳහන් පරිදි ආදායම් ප්‍රකාශය, ශේෂ පත්‍රය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීමට උපයෝගි කරගත් සටහන් ද පැහැදිලිව සටහන් කළ යුතුය.

10.3 ඉන් අනතුරුව, පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ දිස්ත්‍රික් විගණන අංශයට භාරදිය යුතුය. එම මූල්‍ය ප්‍රකාශන සමඟ 2014 වර්ෂයේ විගණන කටයුතු සිදු කර දෙන ලෙස කරන ලද ඉල්ලීමක් ද ප්‍රජා මූල බැංකු අංශයේ අධ්‍යක්ෂට පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

**11. දිවි නැගුම ප්‍රජාමූල බැංකු/බැංකු සමිති ගොඩනැඟිලි ඉදිකිරීම් /අළුත්වැඩියා සඳහා ප්‍රතිපාදන ලබා දීම.**

2014/12/31 දින දක්වා මෙම වර්ෂය තුළ ගොඩනැඟිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන අදාල ඉදිකිරීම් අවසන් ගෙවීම් කළ නොහැකිවේ නම් ඉදිකිරීම් සිදු කරනු ලබන ප්‍රජාමූල බැංකුවේ / බැංකු සමිතියේ ඒ සඳහා වන ගිණුමේ රඳවා තබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙමි. එමෙන්ම අදාල ඉදිකිරීම් කටයුතු ඊළඟ වර්ෂයේ මුලදි අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

**12. මාසික බැංකු ප්‍රගති වාර්තා ලබාදීම.**

දිවිනැගුම ප්‍රජා මූල බැංකු විසින් 2014.12.31 දිනට වර්ෂ අවසාන ගිණුම් පියවීමට කටයුතු සිදු කළ යුතුය. ඒ අනුව ගිණුම් පියවීමට පෙර හා පසු ශේෂ පරික්ෂණය සකස් කිරීම අවසන් කර, සුපුරුදු පරිදි ප්‍රගති වාර්තා හා ශේෂ පරික්ෂණ (පෙර/ පසු) හඳුන්වාදී ඇති ආකෘතියට අනුව පරිගණක ගත කර සංයුක්ත තැටියක් (CD ) මඟින් 2015.01.10 දිනට පෙර ප්‍රජා මූල බැංකු සමිතිය වෙත කඩිනමින් ලබාදීම සිදු කල යුතුය.

**13.** දිවිනැගුම ප්‍රජා මූල බැංකු / බැංකු සමිති සඳහා 2014 නොවැම්බර් දෙසැම්බර් හා 2015 ජනවාරි මාස තුල සියලුම නිවාඩු දිනයන්හි සේවය කිරීමට අවසරදීම.

13.1 2014 වසරේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, තැන්පත්කරුවන්ට පොලි ගෙවීම, ශේෂ පිරික්සුම් ලබාගැනීම, ආයෝජන කටයුතු ආදිය කඩිනමින් අවසන් කිරීමට 2014 නොවැම්බර්, දෙසැම්බර් මස හා 2015 ජනවාරි මාසයේ 31 දින දක්වා සියළුම රජයේ නිවාඩු දින හා සති අන්ත නිවාඩු දිනවල ප්‍රජා මූල බැංකු/ ප්‍රජා මූල බැංකු සමිති විවෘත කර රාජකාරිවල නිරතවීමට අවසර දෙනු ලැබේ.

31.2 එම දිනයන්හි රාජකාරිවල නිරත නිලධාරීන්ට ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති වියදමින් දින වැටුප් ලබාගැනීමට අවසර ඇත.

**13. දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ බැංකු සමිති වාර්ෂික නිලවරණ පැවැත්වීමට වියදම් දැරීම.**

වාර්ෂික ප්‍රජා මූල බැංකු පාලක මණ්ඩල සංවත්සරය හා ප්‍රජා මූල බැංකු සමිති විධායක කමිටු පත් කිරීමේ වාර්ෂික නිලවරණය සඳහා අවශ්‍ය වන්නා වූ වියදම් අදාල බැංකු/බැංකු සමිති අරමුදලින්, අරපිරිමැස්මකින් පාලක මණ්ඩල අනුමැතිය මත වියදම් කිරීමට අනුමැතිය ලබාදෙන්නෙමු. මෙම සංවත්සරය වෙනුවෙන් පොදු සුභ සාධක අරමුදල් ඇතුළු වෙනත් වෙන් කිරීම් භාවිතයට නොගත යුතුය. ඒ සඳහා අවසර ඉල්ලීම් ද නොසලකා හරින බව දන්වා

සිටිමි. තවද ග්‍රාමීය ප්‍රජා මූල සංවිධානවල වාර්ෂික සම්මේලන එම සමිති අරමුදලින් සිදු කරගත් යුතුය.

14. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල, සේවයේ නියුතු නිලධාරින් ඉටු කරන සේවය සලකා බලා, මාසිකව දීමනාවක් ලබාගැනීමට අනුමැතිය ලබාදී ඇත. පහත කරුණු සම්පූර්ණ වී ඇති බවට ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු සෑහීමකට පත්වන්නේ නම්, එම දීමනාව 2014 වසරටම බැංකු නිලධාරීන්ට ලබාගැනීමට අනුමැතිය ලබාදිය යුතුය.

i. දෛනික ඉටු කළ යුතු පොදු ලෙජරයේ සටහන් තබා තුලනය කර තිබීම හා පොදු ලෙජරයේ දෛනිකව තුලනය කර යාවත්කාලීනව පවත්වා ගෙන යාම.

ii. දිවිනැගුම සහනාධාර මුදල් හා අනිවාර්ය ඉතිරි ගිණුම්වලට බැර කළ යුතු අරමුදල්, අරමුදල් ලැබී සියළුම ගිණුම්වලට බැර කර තිබීම. (අරමුදල් ගිණුම්වල පිළිගත හැකි හේතූන් මත ගිණුම්වලට බැර කිරීමට අපහසු අරමුදල් පමණක් හැර අනිකුත් අරමුදල් බැර කර තිබිය යුතුයි.)

iii. මාසිකව පුද්ගලික තැන්පතු හා ණය ශේෂයන්, ආයෝජන අරමුදල් ශේෂ පිරික්සුම් ලබාගෙන තිබීම.

15. දිවිනැගුම ප්‍රජා මූල බැංකුවල පවත්වාගෙන යන, "ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් දරන ලද වියදම් සඳහා වෙන් කිරීම් ගිණුම" (කේත අංක 4033) 2015.01.01 දින සිට ඉදිරියට ග්‍රාමීය ණය අවශ්‍යතා පිරිමසා ගැනීමේඅරමුදල් ගිණුම" ලෙසට පරිවර්තනය කර පවත්වාගෙන යායුතුය.

දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති විසින්, පවත්වාගෙන යන ගිණුම තවදුරටත් එම නමින්ම පවත්වාගෙන යෑමට උපදෙස් ලබාදෙන්නෙමු.

16. දිවිනැගුම ප්‍රජා මූල බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදි කිරීම හා සංවර්ධනයට ලබාදුන් අරමුදල්, එම බැංකුවල තවදුරටත් රඳවාගෙන, කඩිනමින් වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

**17. 2015 නව වසරෙහි වැඩ ආරම්භ කිරීම.**

17.1 2015 නව වසරෙහි පළමු රාජකාරි දිනය 2015 ජනවාරි මස 01 දිනට යෙදී ඇත. එදින නව වසරෙහි පළමු දින ගණුදෙනු කටයුතු සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකුව වෙත පැමිණෙන ලෙස ගණුදෙනුකරුවන්ට සුහදත්වයෙන් ආරාධනා කළ යුතුය.

17.2 එදින සිංහල චාරිත්‍ර අනුව දේශිය රසකැවිලි කිහිපයක් සහිත තේ පැන් සංග්‍රහයක්, ප්‍රජා මූල බැංකුවේ වියදමින් පැවැත්වීමට කටයුතු කළ යුතුය. එම සංග්‍රහය ප්‍රජා මූල බැංකුව වෙත පැමිණෙන ගණුදෙනුකරුවන්ට, පාලක මණ්ඩල සාමාජිකයන්ට, වසම්වල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරිනට සුහදත්වයෙන් පිරිනැමීමට කටයුතු කළ යුතුය. මේ සඳහා රු. 5,000/- කට යටත්ව ප්‍රජා මූල බැංකුවකට වැය දැරීමට හා එම වියදම් වැය ගිණුම - සංග්‍රහ වියදම් යටතේ ගිණුම් තැබීමට අනුමැතිය ලබාදෙමු.

ආර්.ඒ.ඒ.කේ. රණවක,
අධ්‍යක්ෂ ජනරාල්.